# සිංහල ප්‍රස්ථා පිරුළු

"කෙරෙන්ට ඕනෑ වැඩේට තමනුත්, නොකෙරෙන්ට ඕනෑ වැඩේට අනුනුත් යන්ට ඕනෑලු".

"අති පණ්ඩිතයාට ඒදන්ඩේ යන්නත් බැහැ".

"කළුවා මාරපන් ගියා වගෙයි".

"ඕනෑ කමට නෑ කමක් නැතිලු".

"අත්තෙන් අත්තට පනින කුරුල්ලා තෙමිලා නගී".

"නොයන ගමනට මග කුමටද විතාලේ".

"ගමරාලගේ වංගෙඩිය වගෙයි".

"කොබෙයියා ඇටවූ උගුලෙනුත් ඇස් කණ වෙනවලු".

"රත්රන් ඉදිකටුවෙනුත් රිදෙනවලු".

"ගිලීමලෙත් ඇත දත සුද්දෝ—සොළී කෙරෙත් ඇත බඩ පුප්පන්නෝ".

"නටන්ට බැරිවා නොවෙයි පොලොවේ ඇද".

"හිත ඇත්නම් පත කුඩාද?".

"දුර තිබෙන කම්මලට වඩා ලඟ තිබෙන කැටගල හොඳයි".

"අකලට පලගත් ගෙඩිය වගෙයි".

"අඟුර ගලගා සුදු දැකිය හැකිද?".

"අතුර මැදදී අත්වැල කැඩුනා වගෙයි".

"කටවහ ඇති ගෑණි ඇතිකරන කිකිළිත් අඬලනවාලු".

"ඇහැලෙපොලගේ මූල වනසමැයි සිතා ඇහැල මුල් ඉගුල්ලුවා වාගේ".

"බුදුන් අටවන්නෙත්, සඟුන් අටවන්නෙත් මම බොන රා ලබ්බෙටයි බේබද්දෙක් කීවාලු".

"මුහුද කැඳ උනත් හැන්ද නැන්දා අතෙයි" කිව්වා වාගේ.

"අල්ලපු අත්තත් නැහැ පය ගහපු අත්තත් නැහැ".

"කපුරු හාමි උනත් කට ගඳයි".

"කුලමල නැති වෙන්ට බේතකි වී කාසි".

"කෙතේ ගොයම් මුවන් කෑවාට ගෙදර අවුත් මුව හමට තඩි බෑ මොට්ට ගමරාල වාගේ".

"ඉත්තෑවාගේ ගුලේ කබල්ලෑවා රිංගාගෙන මුත්තාපා කීවත් යන්නේ නැහැයි කීවා වාගේ".